# ශ්‍රී ලාංකේය ඡායාරූප ශිල්පීන්ගේ තොරතුරු ලබාගැනීම.

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා කලා මණ්ඩලය යටතේ පිහිටුවා ඇති රාජ්‍ය ඡායාරූප උපදේශක සභාවේ ප්‍රධානතම කාර්යය වනුයේ ඡායාරූප ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය උදෙසා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා එමඟින් රාජ්‍ය මැදිහත් වීමෙන් උසස් ප්‍රමිතියෙන් යුතු ඡායාරූප කලාවක් බිහිකිරීම සහ ප්‍රබුද්ධ ඡායාරූප රසඥතාවක් ඇති කිරීම සඳහා දායක වීමයි.

මේ වැඩසටහන යටතේ,

1. දිවයිනේ සිටින ඡායාරූප ශිල්පීන්ගේ තොරතුරු පද්ධතියක් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව තුළ පවත්වාගෙන යාම.
2. මෙමගින් දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ඡායාරූප උපදේශක සභාව විසින් සංවිධානය කරනු ලබන දේශන, වැඩමුළු සහ ඡායාරූප ප්‍රදර්ශනයන් පිළිබඳව දැනුවත් කිරීමට හැකි වීම.
3. කලාකරු හැඳුනුම්පත ලබාගැනීමේදි ඡායාරූප ශිල්පියෙකු ලෙස සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ තොරතුරු පද්ධතියට ඇතුළත්වී සිටීම එක් සුදුසු කමක් ලෙස සලකා බැලීම.
4. දේශීය හා විදේශීය ප්‍රදර්ශන සහ වැඩමුළුවලට සම්බන්ධ කරවීමට හැකි වීම.
5. රාජ්‍ය ඡායාරූප උපදේශක සභාවේ උපදෙස් මත නිකුත් කරන චක්‍රලේඛන සම්බන්ධයෙන් දැනුවත් කිරීම.
6. රාජ්‍ය ඡායාරූප සම්මාන උලෙළ සම්බන්ධයෙන් දැනුවත් කිරීම.

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව රාජ්‍ය ඡායාරූප උපෙද්ශක සභාවේ උපදේශකත්වය මත සිදු කරනු ලබන උක්ත සඳහන් වැඩසටහන් සහ අනෙකුත් දැනුවත් කිරීම් දිවයිනේ සියලුම ඡායාරූප ශිල්පින් වෙත රැගෙන යාමේ තවත් එක් පියවරක් ලෙස මෙම වැඩසටහන හඳුන්වා දිය හැකිය. ඒ සඳහා සකස් කරන ලද අයදුම්පත්‍රය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රවර්ධන අංශයෙන් හෝ දිවයිනේ පිහිටි දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු සංස්කෘතික නිලධාරීන් මගින් ලබාගත හැකිය. එලෙස ම අදාළ අයදුම්පත්‍රය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ **"Department of Cultural Affairs"** යන ෆේස්බුක් පිටුවෙන් හා www.culturaldept.gov.lk යන වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ඔබ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංස්කෘතික නිලධාරිගෙන් නිර්දේශ කර **2024 ජුනි මස 28** වන දිනට පෙර **අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.** යන ලිපිනයට තැපැල් කිරීමට හෝ විද්‍යුත් තැපැල (E-mail) Photographydca2020@gmail.com යන ලිපිනයට යොමු කළ හැකිය. සාමාන්‍ය තැපෑලෙන් අයදුම්පත්‍රය එවන්නේ නම් අයදුම්පත්‍රය බහලන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ **"ඡායාරූප ශිල්පීන්ගේ තොරතුරු ලබාගැනීම"** ලෙස සඳහන් කළයුතුය.

යසින්තා ගුණවර්ධන
අධ්‍යක්ෂ
සංස්කෘති කටයුතු දෙපාර්තමේන්තුව
2024.06.

විමසීම්: -රාජ්‍ය ඡායාරූප ප්‍රවර්ධන අංශය - 0113167540